සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All rights reserved.

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

21 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2026 - (අනුහුරු ප්‍රශ්න පත්‍රය)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Ord.Level) Examination, 2026

සිංහල භාෂාව හා සාහිත්‍යය	I, II
சிங்களமொழியும் இலக்கியமும்	I, II
Sinhala Language and Literature	I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time-10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා තෝරා ගැනීමටත් උත්තර ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න

සිංහල භාෂාව හා සාහිත්‍යය I

උපදෙස්:

(i) සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. **ඉබාගාතේ** යන සමාජයක් නිසි මහට ගැනීම ඉතා අසීරු කාර්යයකි.

(1) එක් අරමුණක් පසු පස හඹා යන
(2) නොමනා ගති සිරිත් අනුගමනය කරන
(3) අරමුණකින් තොර ව කටයුතු කරන
(4) නොමහට පිළිපන් අය අනුකරණය කරන

2. නීති විරෝධී ක්‍රියා සඳහා **උල්පන්දම් දීම** දඬුවම් ලැබිය හැකි වරදක් වෙයි.

1) රහසින් අනුබල දීම (2) අවි ආයුධ සැපයීම (3) කුමන්ත්‍රණය කිරීම (4) වචනයෙන් උපදෙස් දීම

3. අහිංසකයකු අල්ලා ගෙන **අත්වල හිරි ඇරගත්** පුද්ගලයන් කිහිප දෙනෙකු අත් අඩංගුවට ගැනීමට පොලීසිය සමත් විය.

(1) අතින් පයින් පහර දුන්
(2) අත් බැඳ ප්‍රහාරයට ලක් කළ
(3) පහර කෑමට ලක් වූ
(4) රිසි සේ පහර දුන්

- **අංක 4 සිට 6 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පද තෝරන්න.**

4. පැරණි දළදා පෙරහැර සංස්කෘතිකාංග ..... වඩා රාජ්‍ය බලය පෙන්වීමට අවස්ථාවක් වූ බව පැරණි වාර්තාවල කියවේ.

(1) විමර්ශනයට (2) ගවේෂණයට (3) නිරූපණයට (4) ප්‍රදර්ශනයට

5. තම දරුවන් සමාජයේ යහපත් ව දිවි ගෙවනු දැකීම දෙමව්පියන්ගේ එක ම ..... වන්නේ ය.

(1) තීරණය (2) ඉල්ලීම (3) අභිප්‍රාය (4) අවධානය

6. ශ්‍රී ලංකාව පිළිබඳ කියවූ පමණින් වුව ද දේශානුරාගයක්..... වූ බව විදේශීය කතුවරු පවසති.

(1) සංජානනය (2) අභිජනනය (3) ස්මරණය (4) ජනනය

Past Papers Wiki

7. අකාරාදි පිළිවෙළ නිවැරදිව දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) අලිගැටපේර, අඹ, අන්නාසි, බෙලි
(2) අනෝදා, ඇපල්, දුරියන්, දොඩම්
(3) නාරං, දිවුල්, මැංගුස්, රඹුටන්
(4) උගුරැස්ස, දෙළුම්, හිඹුටු, වරකා

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) ගෘහස්ථ, හෘදයංගම, ලේඛනය, මද්‍යසාර
(2) අබිධර්මය, මළල ක්‍රීඩා, නිෂ්ඵල, ව්‍යූහය
(3) ප්‍රශ්න පත්‍ර, ශීඝ්‍රගාමී, හස්තීයා, අධ්‍යනය
(4) ස්වාභාවික, පරිගනකය, ආස්වාදය, ඵෙක්‍යය

9. සෑම වචනයක ම **පළමු අකුරෙහි** යංශය, රකාරාංශය, ගයනුකිත්ත, ගැටය සහිත ඇලපිල්ල පිළිවෙළින් යෙදුණු වරණය තෝරන්න.

(1) ව්‍යාපෘති, පෞරාණික, ශ්‍රවණය, වෘද්ධ
(2) ත්‍යාගශීලී, ප්‍රමාණය, පෞද්ගලික, කෘතවේදී
(3) ව්‍යාකරණ, නෘත්‍ය, නෛකාව, ප්‍රසිද්ධ
(4) ව්‍යාපාරිකයා, සෞන්දර්යය, ක්‍රමවත්, න්‍යාය

10. දන්තජ ව්‍යඤ්ජනාක්ෂර පමණක් යෙදුණු වරණය තෝරන්න.

(1) දසත
(2) ලබන
(3) විජය
(4) සහන

11. ඔහු කණ්ඩායමෙහි සිටින ප්‍රබල පිතිකරුවෙකි. මෙහි '**ප්‍රබල**' යන්න අයත් වන්නේ,

(1) විශේෂණ සමාසයට ය.
(2) දකාරාර්ථ සමාසයට ය.
(3) අව්‍යය සමාසයට ය.
(4) අන්‍යාර්ථ සමාසයට ය.

12. අනුක්ත නාම පද දෙකක් සහිත වරණය තෝරන්න.

(1) මාගමක්, බමුණෝ, නිලධාරිනියක, උගත්තු

(2) වෛද්‍යවරු, ළඳැරියක, සර්පයෙකු, කෙනෙකු

(3) නිරූපිකාවන්, ජයග්‍රාහකයෝ, කොක්කු, දක්ෂයෙක්

(4) ලිපිකරුවකු, භික්ෂුවක, දෙවහනක්, සහායිකාවක්

13. 'නිවසෙහි විදුලි බුබුළු දැල්විණි' යන වාක්‍යයෙහි '**නිවසෙහි**' යන්නෙහි විභක්තිය නම් කරන්න.

(1) අවධි
(2) ආධාර
(3) කරණ
(4) සම්බන්ධ

14. 'ප්‍රසංග + ඉක' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වීමෙන් සෑදෙන වචනය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

(1) ප්‍රාසාංගික
(2) ප්‍රසාංගික
(3) ප්‍රසංගික
(4) ප්‍රාසංගික

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

(1) නිපාත - විසින්, යෙහෙන්, නිබඳ, ඉතින්
(2) කෘදන්ත - පිහුම්, වැයුම්, ඇදුම්, වැනුම්
(3) සමාස - දිගුවරල, රටවැසි, ඇත්දළ, තුන්බිය
(4) තද්ධිත - පාපතර, නවතම, කළටි, මිණිමුවා

16. **අනියමාර්ථ අසම්භාව්‍ය** ක්‍රියාවක් යෙදී ඇති වාක්‍යය කුමක් ද?

(1) පියා නිවසට එද්දී දරුවෝ පෙරමඟට දිව ගියහ.
(2) උත්සාහ කරතොත් ජය අත් වනු නිසැක ය.
(3) ගංවතුර බැස යත් ම වසංගත රෝග පැතිරෙයි.
(4) වැසි වසින ගංගා, ඇළ, දොළ පිරී යයි.

- **අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.**

17. වායුගෝලීය ක්ෂණික වෙනස්වීම් පිළිබඳ **පුරෝකථනය** කිරීම කාලගුණ විද්‍යාඥයන් හමුවේ ඇති අභියෝගයකි.

(1) පූර්වෝක්ති දැක්වීම
(2) ස්ථිර ලෙස පැවසීම
(3) කල් ඇති ව ප්‍රකාශ කිරීම
(4) පසු ව දැනුම් දීම

18. අපි සැම නන් පැහැ විදුලි බුබුළුවලින් **සමලංකෘත** උත්සව ශාලාවට පිවිසුණෙමු.

(1) සිත් ගන්නා පරිදි සැකසූ
(2) සමාන ලෙස සරසා ඇති
(3) ආකර්ෂණීය බවින් යුත්
(4) මැනවින් අලංකාර කරන ලද

19. බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය නා හිමි චරිතයෙහි **පිදිය යුතු** ගුණාංග සමුදායක් ගැබ් වෙයි.

(1) අර්චනීය (2) සාධනීය (3) අභිමානනීය (4) කමනීය

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නොපවත්නා** පද පේළිය තෝරන්න.

(1) ආරෝග්‍ය ශාලාව, රෝගියා, හෙදිය, ඖෂධ
(2) ගීතය, වාද්‍ය වෘන්දය, රසිකයා, ගායකයා
(3) ලඹය, සවල, බදාම, නියන
(4) කරපිංචා, හොද්ද, ලුණු, පොල්කිරි

21. **සමානාර්ථ පද යුගල** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1)	සොඬු - කම්මුල්	අග්නි - වහ්නි	වන - අටවි	තරඟ - රැලි
(2)	කලංක - කල්ක	ප්‍රජාව - ජනතාව	අකුස්ස - හෙණ්ඩුව	කෝ - කෝප
(3)	පවිත්‍ර - පිවිතුරු	චාරිත්‍ර -විරිත්	රුවන් - රන්	තරු - තුරු
(4)	ආගම - සමය	ශීර්ෂ - සිරස	ගගන - ගුවන	නිරාකුල - ව්‍යාකුල

22. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් **නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) නිතර - නිරතුරු, නිබඳ, නිති, අනවරත
(2) සඳ - සොමී, සිසි, තුසරකර, හිමකර
(3) අරවින්ද - පංකජ, සහස්පත, උපුල්, පද්ම
(4) පිළිමල් - සතුරු, අරි, ශත්‍රු, පසමිතුරු

23. **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.

(1) කෘත්‍රිම - ස්වාභාවික
(2) අනතිමානී - නිහතමානී
(3) විශේෂ - සාමාන්‍ය
(4) සජ්ජන - දුර්ජන

24. **වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) 'ඖ' යන්න සැකසෙන්නේ 'අ +උ' යන ස්වර දෙක සංයුක්ත වීමෙනි.
(2) 'සිසිලස්' යනු ස්වාර්ථයේ තද්ධිත නාමයකි.
(3) 'නරලොව' යනු විභක්ති සමාස පදයකි.
(4) 'හෙතෙම' යන්නෙහි අනුක්ත රූපය 'ඔහු' යන්නයි.

25. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත, අර්ථාන්විත වාක්‍යය තෝරන්න.

(1) බස දැනීම වූකලී එක් එක් අය තුළ එක් එක් ප්‍රමාණයට සමාන ව පිහිටා තිබිය හැක්කකි.

(2) විචාරය යි කියන්නේ කාව්‍ය රස විඳීමයේ මනා පරිචය ඇති අයගේ ප්‍රකාශනයටයි.

(3) කලාතුරකින් සතතාභ්‍යාසය යනු නිර්මාණකරණයෙහි යෙදෙමින් ලබා ගන්නා ප්‍රාගුණ්‍යයයි.

(4) සිත තුළ උපන් අද්දැකීම් ඇසුරු කර ගෙන හැඟීම් කවියකට නැඟීම කාව්‍ය නිර්මාණකරණයයි.

- **අංක 26, 27 ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහස්වලට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළු තෝරන්න.**

26. නුසුදුස්සාට බුහුමන් දැක්වූ විට අස්ථානයේ උඩඟු බවට පත් වීම

(1) පිදුරු ගොඩේ ඉන්න බල්ලා වගේ
(2) අස්සයාට අං ආව වගේ
(3) කටුස්සාගෙ කරේ රන් බැන්දා වගේ
(4) එළිපත්ත උඩ ඉන්න බළලා වගේ

27. අරමුණකින් තොර ව වැඩ කිරීම

(1) පරංගියා කෝට්ටේ ගියා වගේ
(2) කළුවා මාරපන් ගියා වගේ
(3) ගමරාල දිවිය ලෝකෙ ගියා වගේ
(4) අබරා සිල් ගත්තා වගේ

28. ස්වරාදේශ සන්ධියට හා ගාත්‍රාදේශ සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) දැවුරුදු, සිතියම් (2) සිතියම්, තුනුවග (3) තුනුවග, දැවුරුදු (4) දැවුරුදු, මෙහෙසුරු

- **අංක 29, 30 යටතේ දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.**

29. (1) අපි යහපත් මිනිස්සු සේ හැසිරෙමු.
(2) මිගිදා හෙවත් ගිජිදා වනයේ ආධිපත්‍යය දරන්නේ ය.
(3) ගොවියෝ විසින් ගවයන් ආරක්ෂා කරති.
(4) බඹරුන් දෂ්ට කරති'යි අපි බිය වීමු.

30. (1) ඔවුහු තුමූ නිතර පොත් කියෙව්වේ ය.
(2) මා කිසිදු දිනෙක සතකු මරා නැත.
(3) සියලු මිනිස්සු සත්‍යගරුක විය යුතු ය.
(4) දරුවෝ දෙමාපියන්ට කීකරු වීම මැනවි.

31. පහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

- දෙවියන් ..... මිනිසුන් නිසා සමාජයට ඉමහත් යහපතක් සිදු වේ.
- මව්බිම ..... දිවිහිමියෙන් කැපවූවෝ අමරණීය වෙත්.
- සසුනෙහි උකටලී වූ භික්ෂූන් ..... බුදුන් වහන්සේ කළ දේශනා ත්‍රිපිටකයෙහි ඇතුළත් වේ.
- ඈ දරුවන් ..... සතුටින් නිවාඩුව ගත කළා ය.

(1) අරභයා, සමඟ, වෙනුවෙන්, වැනි
(2) සමඟ, අරභයා, වැනි, වෙනුවෙන්
(3) වැනි, වෙනුවෙන්, අරභයා, සමඟ
(4) වෙනුවෙන්, වැනි, සමඟ, අරභයා

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි උත්තරය කුමක් ද?

'පවුලගෙ මහන්තත්තේ තිබුණට මං කොහොමද මේ ඔක්කොම කරන්නේ'

(1) පවුලේ අහංකාරකම ඇතත් සියලු දේ කරන්නේ කෙසේ ද?

(2) භාර්යාවගේ මහත බව ඇතත් මේ සියල්ල කළ යුතු ය.

(3) පවුල විශාල වුව ද මා සියල්ල කරන්නේ කෙසේ ද?

(4) භාර්යාවගේ අහංකාරකම ඇතත් මේ සියලු කටයුතු මා කරන්නේ කෙසේ ද?

33. 'අකීකරු පුත්‍රයෙකුගේ ලෝකය' කාව්‍ය සංග්‍රහයෙන් උපුටාගෙන ඇති කවි පෙළ වන්නේ,

(1) සූරිය මල (2) කෙකටිය මල්
(3) පැණි කොමඩු (4) උදය

34. පහත සඳහන් කවියේ හතරවන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

මැනලා වී දෙකක් නොලැබී මල්ලකට
දරුවොත් එක්ක මම වැටිලා ඉන්නකොට
අම්මා ඇවිල්ලා හීනෙන් දොරකඩට
.....

(1) යම්දෝ හෙට උදේ අපි ආපසු ගමට (2) මට මගේ කඳුළු සිතල විඳ ගන්ට
(3) උඹ වරෙන් පුතේ හනිකට මා ළඟට (4) ඇහුවා මගෙ පුතේ කිරි ඕනැද උඹට

35. "අනන්ත අප්‍රමාණ සක්වළ සත්ත්වයන් කෙරෙහි කරන්නා වූ මෛත්‍රිය **හබ බිජුවකට මහමෙර පෙරළන්නා සේ** එක ඇත්හු කෙරෙහි පතුරුවා..." මෙහි තද කළු අකුරින් දැක්වෙන කොටස,

(1) ස්වභාවෝක්තියකි. (2) උපමාවකි. (3) රූපකයකි. (4) උත්ප්‍රේක්ෂාලංකාරයකි.

36. "මෛත්‍රෙය හිමියන්ගේ මහා පාණ්ඩිත්‍යය ප්‍රඥා බල මහිමය අබිමුව උගතුන් යැයි කියා ගන්නා බොහෝ දෙනා හිරු ඉදිරිපිට කදෝපැණියන් සේ ය" යන වාක්‍යයේ 'කදෝපැණියන්' යන්නෙන් අදහස් කරන්නේ,

(1) කොඳමල් යන්නයි. (2) කුඩා පොකුණු යන්නයි.
(3) කණාමැදිරියන් යන්නයි. (4) මීවදවල පැණි යන්නයි.

37. ධීවර භාෂාවේ 'මරක්කලාහේ' යනු,

(1) ඔරුවේ අයිතිකරු ය. (2) ධීවර කණ්ඩායමේ නායකයා ය.
(3) දැල් අදින පුද්ගලයා ය. (4) පළමු වරට මුහුදු යන්නා ය.

38. 'කෝකිල සන්දේශය' රචනා කරන ලද්දේ,

(1) අලගියවන්න මුකවෙටි පණ්ඩිතයන් විසිනි.

(2) කවීශ්වර පණ්ඩිතයන් විසිනි.

(3) පතිරාජ පිරිවෙන්පති හිමි විසිනි.

(4) ඉරුගල්තිලක පිරිවෙන්පති හිමි විසිනි.

39. "එක පැහැයෙන් ඉඳිතත් කොවුලනට බඳු
නද පමණින් දැන ගත හැකි රිටුන් ඉඳු"

මේ කවි දෙපදයෙහි අදහස නිසි ලෙස දැක්වෙන වරණය තොරන්න.

(1) කොවුලන් හා රිටුන් නාදයෙන් මෙන් ම පැහැයෙන් ද අසමාන නොවෙති.

(2) කොවුලන්ගේ නාදය රිටුන්ගේ හඬ අභිභවා දසත විහිදී යයි.

(3) එක අත්තක හිඳ නාද කරන විට කොවුලන්ට බඳු හඬක් රිටුන්ට නැත.

(4) පැහැයෙන් සමාන වුවද කොවුලන්ගේ හා රිටුන්ගේ වෙනස නාදයෙන් ම ප්‍රකට වේ.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

"සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලීත්වය හෙළි වන්නේ ඔහු සිය නිර්මාණය සඳහා අර්ථවත් අද්දැකීම් තෝරා ගැනීම හා ඒ අද්දැකීම් පාඨකයාට චින්දනයක් ඇති වන ආකාරයෙන් නැවත ඉදිරිපත් කිරීම සිදු කර ඇති අන්දම අනුව ය."

(1) සාහිත්‍ය නිර්මාණයක් සඳහා අර්ථවත් අද්දැකීම් තෝරා ගැනීම හා අද්දැකීම් නැවත ඉදිරිපත් කිරීම මඟින් සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලීත්වය හෙළි වේ.

(2) සාහිත්‍ය නිර්මාණකරුවාගේ නිර්මාණශීලීත්වය හෙළි වන්නේ, අද්දැකීම් පාඨකයාට චින්දනයක් ඇති වන සේ ඉදිරිපත් කිරීමෙනි.

(3) අර්ථවත් අද්දැකීම් තෝරා ගැනීමත් ඒ අද්දැකීම් පාඨකයාට චින්දනයක් ඇති වන සේ නැවත ඉදිරිපත් කිරීමත් සිදු කර ඇති අන්දම අනුව සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලීත්වය හෙළි වේ.

(4) අද්දැකීම් තෝරා ගැනීම හා ඒ අද්දැකීම් පාඨකයාට චින්දනයක් ඇති වන සේ ඉදිරිපත් කිරීමත් නිර්මාණශීලීත්වය ලෙස හැඳින්විය හැකි ය.

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/All rights reserved.

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

21	S	I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2026 - (අනුහුරු ප්‍රශ්න පත්‍රය)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Ord.Level) Examination. 2026

සිංහල භාෂාව හා සාහිත්‍යය	I, II
சிங்களமொழியும் இலக்கியமும்	I, II
Sinhala Language and Literature	I, II

සිංහල භාෂාව හා සාහිත්‍යය - II

❋ **ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට හිමි වන ලකුණු සංඛ්‍යාව 80 කි.**

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) (අ) කණ්ඨ තාලුජ අක්ෂරයක් ලියන්න.
(ආ) දන්ත ඕෂ්ඨජ අක්ෂරයක් ලියන්න.

(ii) පහත දැක්වෙන වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම **වචන දෙක** පමණක් නිදොස් කර ලියන්න.
"බුදු හිමියෝ මහ කුළුණු ගුණය පෙරදැරි ව සියලු සත්ත්වයන්ට ආශිර්වාද කළහ"

(iii) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(අ) ආගන්තුක
(ආ) ප්‍රදාන

(iv) පහත දැක්වෙන අදහස්වලට ගැළපෙන ඡත්‍ර පද ලියන්න.
(අ) දැව කඳක මේරූ කොටස
(ආ) යමක් අපූර්වත්වයෙන් යුතු ව නිර්මාණය කිරීමේ හැකියාව

(v) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් තද්ධිත පදයක් හා කෘදන්ත පදයක් උපුටා ලියන්න.
"පණිහාරත දේශීය නර්තන කලා අඹරෙහි සදා සුදිලෙන පහන් තරුවයි."

(vi) පහත දැක්වෙන වාක්‍ය ව්‍යාකරණානුකූල ව සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) නිලධාරීන් කාර්යාල පරිශ්‍රයෙහි ඇත.
(ආ) ඇතැම් මිනිස්සු සත්තු වැනි හැසිරීම් ඇත්තෝ ය.

(vii) පහත සඳහන් පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කර දක්වන්න.
(අ) නිවාසයෙන්
(ආ) සෝදමින්

(viii) පහත සඳහන් යෙදුම්වල පළමුවන වචනය හා දෙවන වචනය එකිනෙක නොගැළපෙයි. වඩාත් ගැළපෙන ලෙස පළමුවන වචනය හෝ දෙවන වචනය හෝ සකස් කර ලියන්න.
(අ) විශේෂ කරුණු
(ආ) මිහිරි නාද

(ix) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් නිපාත පදයක් ද උපසර්ගයක් සහිත පදයක් ද උපුටා ලියන්න.
"ඇතැම් රටවල් ගන්නා ආත්මාර්ථකාමී තීරණ හේතු කොට ගෙන බොහෝ රටවල් දුෂ්කරතාවන්ට පත් වී ඇත."

(x) පහත සඳහන් වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියන්න.
(අ) කිමිදුම්කරුවන් විසින් ජල ගැලීමට හසුවූවෙක් මුදා ගැනිණ.

(ආ) පක්ෂීන් විසින් අතු ඉතිවල කැදලි තනනු ලබයි.

(ලකුණු 2 × 10 = 20යි.)

2. පහත දැක්වෙන **(අ), (ආ), (ඇ), (ඈ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට නොඅඩු** වන සේ රචනයක් ලියන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

(අ) සාහිත්‍යය හා කලාව ඇසුරෙහි ජීවත් වීමෙන් මානවයා සමාජ සංවේදී අයෙකු බවට පත් වෙයි. කවිය, කෙටිකතාව, නවකතාව ආදි සාහිත්‍යාංගවලින් පාසල් දරුවන් දුරස් වීමේ ප්‍රවණතාවක් වර්තමානයෙහි දැකිය හැකියි යන්න බොහෝ දෙනෙකුගේ අදහස වී තිබේ. සාහිත්‍ය කලාව කෙරෙහි යොමුවීමේ වැදගත්කම අවධානයට ගත යුතු ය.

(ආ) තාක්ෂණික මෙවලම් භාවිතය මානව ජීවිතයෙහි නොයෙක් කාර්ය පහසු කරයි. එසේ වුව ද නූතන තාක්ෂණික දියුණුව නිසා ම මිනිස් ශ්‍රමය අවතක්සේරුවට ලක්වීමේ අවදානමක් ද පවතී. විශේෂයෙන් මේ සඳහා කෘත්‍රිම බුද්ධිය වැනි මෙවලම්වල බලපෑම සුළු පටු නොවේ. කෘත්‍රිම බුද්ධියෙහි පවත්නා වාසි මෙන් ම අවාසි කෙරෙහි ද අවධානය යොමු වීම වැදගත් ය.

(ඉ) මැදපෙරදිග කලාපයේ මතුව ඇති යුද්මය තත්ත්වය සමස්ත ලෝකයට ම විශාල බලපෑමක් සිදු කර ඇත. බලශක්ති ක්ෂේත්‍රයට මෙන් ම තවත් ක්ෂේත්‍ර ගණනාවකට එල්ල වන බලපෑම ශ්‍රී ලාංකේය සමාජයට ද අහිතකර ය. මේ සියල්ලට එක ම විසඳුම වන්නේ ලෝක සාමය උදාකර ගැනීමයි. ඒ වෙනුවෙන් සියලු දෙනා පෙළගැසිය යුතු ය.

(ඊ) ලෝකයේ විවිධ රටවල් නොයෙක් ආකාරයේ ආපදාවලට මුහුණ දෙයි. ඒ අතර ස්වාභාවික ආපදා ප්‍රමුඛ ස්ථානයක ලා සැලකිය හැකි ය. මේ හේතුවෙන් විශාල වශයෙන් ජීවිත හා දේපළ හානි සිදු වේ. එබැවින් ස්වාභාවික ආපදා සඳහා පූර්ව සූදානමක් සහිත ව කටයුතු කිරීමේ අවශ්‍යතාව පවතී.

(ලකුණු 25යි.)

3. පහත දැක්වෙන පාඨය වචන **65 – 75** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අවුරුදු දෙසිය තිස්හයකට පසු ව මිහිඳු මහ රහතන් වහන්සේගේ ලංකාගමනය සිදු විය. ලංකා සංස්කෘතික ඉතිහාසයේ අතිශය වැදගත් සිද්ධිය මෙය බව පැහැදිලි වනුයේ එතෙක් තිබූ අඳුරු සංස්කෘතික පසුබිම ඉවත් වී සාහිත්‍යය, ශිල්ප කලා ආදි වශයෙන් මුළු රට පුරා ම නව ප්‍රබෝධයක් ඇති කිරීම කෙරෙහි මෙම ක්‍රියාදාමය බලපෑ හෙයිනි. මහින්දාගමනයට පූර්වයෙහි සිට ම බුදුන් වහන්සේගේ ධර්මය පිළිබඳ මෙරටවාසීන් දැන සිටි බවට සාධක වංශකථා මඟින් හෙළි පෙහෙළි වෙයි.

බුදුන් වහන්සේ අවස්ථා තුනකදී මෙරටට වැඩම කළ බව දීපවංශය, මහාවංශය, සමන්තපාසාදිකාව යන පාලි ග්‍රන්ථයන්හි පැහැදිලිව දක්වා ඇත. පළමු ලංකාගමනය සිදු වූයේ මහියංගණයට ය. එහිදී යක්ෂයන්ට කළ ධර්ම දේශනයෙන් කෝටි ගණනකට ධර්මාභිසමය සිදු විය. මෙම ධර්ම දේශනය ශ්‍රවණය කළ සමන්තකූට අධිපති මහා සුමන දේවතාවා තෙරුවන් සරණ ගොස් සෝවාන් ඵලයට පිවිසි බව මහාවංශයේ සඳහන් වේ. එහිදී සුමන සමන් දෙවියන් බුදුන් වහන්සේගෙන් කළ ඉල්ලීමකට අනුව ලැබුණු පූජා වස්තුවක් වූ කේශධාතු නිදන් කොට අද ද දක්නට ලැබෙන මහියංගණ ස්තූපය ඉදි විය. දෙවන වර ලංකාවට බුදුන් වහන්සේ වැඩම කළේ නාගදීපයට ය. එම ගමනේදී අසූ කෙළක් නාගයන් තිසරණ පන්සිල්හි පිහිටියහ. කැලණියේ මණි අක්ඛිත නා රජුන් බුදු සමය වැලඳ ගත්තේ එහිදී ය. සැබෑ බෞද්ධයෙකු නිසා ම මණි අක්ඛිත නා රජුන්ගේ ඉල්ලීම පිට තුන්වන වරට ද ලංකාවට බුදුන් වහන්සේ වැඩම කළහ. බුද්ධ පරිනිර්වාණයෙන් පසු ව සැරියුත් මහ රහතන් වහන්සේගේ ශිෂ්‍යයෙකු වූ සරභූ තෙරණුවන් ලංකාවට පැමිණියේ බුදුන් වහන්සේගේ අකු ධාතුව ද රැගෙන ය. එම ධාතූන් වහන්සේ මහියංගණ චෛත්‍යයේ තැන්පත් කොට එම චෛත්‍යය දොළොස් රියනකින් උස් කොට තැනවී ය.

(ලකුණු 10යි.)

PAST PAPERS WIKI

4. පහත දැක්වෙන පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි උත්තර** ලියන්න.

අනාදිමත් කාලයක සිට ම අනුරාධපුරය හා ඒ අවට ප්‍රදේශ දේශපාලන මධ්‍යස්ථානයක් වශයෙන් වැදගත් වූ බවට සාහිත්‍යමය මෙන් ම පුරා විද්‍යාත්මක මූලාශ්‍රවලින් ද තොරතුරු හමු වේ. අනුරාධපුරය රාජ්‍ය කේන්ද්‍රස්ථානය වීම නිසා පරිපාලන මධ්‍යස්ථානයක් වශයෙන් ද අද්විතීය ස්ථානයක් හිමි වූ බව සිතිය හැකි ය. එකල පරිපාලනයට සම්බන්ධ වූ නිලධාරීන් පිළිබඳ සෙල්ලිපිවලින් ද තොරතුරු හමු වේ. අතදක, බඩකරක, ගණක, රටික යනාදි වශයෙන් නිලධාරීන් ගණනාවක් ගැන අසන්නට ලැබීමෙන් මෙකල පරිපාලන කටයුතුවලට නිලධාරීන් රැසක් සහභාගි වූ බව සිතිය හැකි ය. මේ නිසා පරිපාලන තන්ත්‍රය හා සම්බන්ධ නිලධාරීන් අනුරාධපුර නගරය වටා කේන්ද්‍රගත වීම බොහෝ දුරට සිදුවන්නකි. තවද අභ්‍යන්තර ගැටුම්කාරී තත්ත්වයන් මෙන් ම විදේශීය ආක්‍රමණ යනාදියට මුහුණ දීම සඳහා විධිමත් යුද හමුදාවකගේ සහාය ලබා ගැනීමට පාලකයින්ට සිදු වූ බව පෙනේ. මේ නිසා යුද හමුදාවට සම්බන්ධ නිලධාරීන්, සොල්දාදුවන් වැන්නන් ද රාජ්‍ය මධ්‍යස්ථානය වටා එක් වූ බව සිතිය හැකි ය. තව ද පරිපාලන කටයුතු ඉටුකර ගැනීමට සෙසු ප්‍රදේශවලින් පැමිණි ජනයා නිසා ද මෙම ප්‍රදේශය වඩාත් ජනාකීර්ණ වන්නට ඇතැයි සිතීමට තුඩු දෙන සාක්ෂි හමු වේ. නගරය පිරිසිදු කිරීමේ කාර්යවල නිරත ව සිටි කම්කරු පන්තියේ ජනයා ද අනුරාධපුර නගරය වටා කේන්ද්‍රගත වූ බව සිතිය හැකි ය. මෙවන් වූ පසුබිම් සාධක නිසා අනුරාධපුර නගරය හා තදාසන්න ප්‍රදේශයන් වඩාත් ජනාකීර්ණ තත්ත්වයකට පත් වූ බව සිතීමට ඉවහල් වන තොරතුරු හමු වේ. ධාතුසේන රාජ්‍ය සමයේ කරන ලද කලා වැව එක ළඟ පිහිටි වැව් දෙකක් ඒකාබද්ධ කිරීමෙන් නිම කරන ලද්දකි. මෙම වැව් ඒකාබද්ධ කර එහි ජලය තිසා වැව කරා ගෙන ගිය බව පෙනේ. නිකොලස් මහතා පෙන්වා දෙන ආකාරයට තිසා වැව විශාල කිරීමෙනුත් නොසෑහී මෙසේ තවත් අතිරේක ජලස්කන්ධයක් අවශ්‍ය වූයේ වාරිමාර්ග කටයුතු සඳහා ම නොව අගනුවර වැඩි වෙමින් පැවති ජනයාට ජල පහසුව සැපයීම සඳහා යැයි යන අදහස මෙහිදී වඩාත් පිළිගත හැකි වේ.

(i) අනුරාධපුර යුගයේ පරිපාලන කටයුතුවලට නිලධාරීන් රැසක් සහභාගි වූ බවට අනුමාන කළ හැකි සාධකය කුමක් ද?

(ii) එවක අනුරාධපුරය වඩාත් ජනාකීර්ණ නගරයක් වීමට බලපාන්නට ඇතැයි සිතීමට තුඩු දෙන හේතු දෙකක් ලියන්න.

(iii) අනුරාධපුරය හා ඒ අවට ප්‍රදේශ දේශපාලන මධ්‍යස්ථානයක් වූ බවට තොරතුරු හමු වන මූලාශ්‍ර වර්ග දෙකක් නම් කරන්න.

(iv) අගනුවර ජනයාට ජල පහසුව සැපයීම සඳහා ද වාරිමාර්ග කටයුතු පැවති බවට අදහස් දක්වන්නේ කවුද?

(v) එකල පරිපාලනයට සම්බන්ධ වූ තනතුරු නාම දෙකක් දක්වන්න.

(ලකුණු 2 × 5 = 10යි.)

5. මෙනේරිපිටිය, කැන්දලියද්ද ලිපිනයේ 'සවිතා' සුබ සාධක සංගමය ප්‍රදේශවාසීන්ගේ පානීය ජල අවශ්‍යතාව සපුරාලනු වස් ග්‍රාමීය ජල ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු සූදානම් කරයි. මා-ඔය කේන්ද්‍ර කොට ගෙන එහි ජලය පිරිපහදු කර ග්‍රාමීය ජනතාවට බෙදා හැරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. ඒ සඳහා අවශ්‍ය ජල මෝටර්, ජල ටැංකි, නළ පද්ධති හා අවශ්‍ය වෙනත් දේ ලබා ගැනීම සඳහා සහයෝගය අපේක්ෂා කරමින් 'ජනෝදා' සංවිධානය වෙත යවන ලිපියක් සකස් කරන්න. ඔබ 'සවිතා' සුබ සාධක සංගමයේ ලේකම් 'ප්‍රශාන් සමන්කුල' යැයි සිතන්න.

නැතහොත්

පහත දැක්වෙන තොරතුරු ඇසුරින් පුවත් පතක පළ කිරීම සඳහා යෝග්‍ය වාර්තාවක් සකස් කරන්න. (මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය).
දංගහවෙල 'රසදීපනී' කලා සංසදය සංවිධානය කරන සාහිත්‍ය රස වින්දන වැඩසටහන ආවරණය කළ පුවත් පත් වාර්තාකරු නිශාදි මාරුද්දන විසින් සකස් කරන ලද දළ සටහනක් පහත දැක්වේ.

- **දිනය:** 2026.12.03 , **වේලාව:** ප.ව. 4.00
- **ස්ථානය:** දංගහවෙල ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය
- **ප්‍රධාන ආරාධිතයා:** ප්‍රවීණ සාහිත්‍යවේදී දීඝායු ආර්යදර්ශන
- **විශේෂ දේශනය:** මහාචාර්ය ආනන්ද පරණවිතාන

මෙම උත්සවයට සමගාමී ව පැවති ගද්‍ය හා පද්‍ය රචනා තරගවල ජයග්‍රාහකයන්ට සම්මාන හා සහතික පත් පිරිනැමීම ද එදින සිදු විය. නැටුම් ගැයුම් සහිත විචිත්‍රාංග රැසක් ද එම වැඩසටහනට ඇතුළත් විණි.

(ලකුණු 15යි.)

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All rights reserved.

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

21	S	III

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2026 - (අනුහුරු ප්‍රශ්න පත්‍රය)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Ord.Level) Examination. 2026

සිංහල භාෂාව හා සාහිත්‍යය	III
சிங்களமொழியும் இலக்கியமும்	III
Sinhala Language and Literature	III

පැය දෙකයි
மூன்று மணித்தியாலம்
Two hours

සිංහල භාෂාව හා සාහිත්‍යය III

වැදගත් :

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට පමණක්** උත්තර සපයන්න.
- **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80** කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට උත්තර **නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) "දෙවැට දිග කරඳවැල් ආරුක්කු යට සැඟව
නිල් කුරුලු බිලිඳු නිදි, ඇහැරවන්නේ කුමට?"

(අ) මෙම පද්‍ය ඛණ්ඩය ඇතුළත් නිර්මාණයේ නම ලියන්න.

(ආ) එහි රචකයා කවරෙක් ද?

(ii) "ඕව ගිහින් කියනව මට නෙවෙයි උසාවියට."

(අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද?

(ආ) මෙය ශ්‍රවණය කළ අයගේ නම ලියන්න.

(iii) පහත දැක්වෙන කවියේ ඉතිරි පද්‍ය පාද දෙක සම්පූර්ණ කරන්න.

"යටැසින් ලන බැල්මෙන් සුර විලසී
වෙසෙසින් දන මන මත් කැර එකසී"

(අ) .....

(ආ) .....

(iv) "...මට එහෙම එකක් ගැන කල්පනාවක් වුණේ ම නැනෙ."

(අ) මෙහි 'එහෙම එකක්' යනුවෙන් අදහස් කළේ කිනම් කරුණක් ද?

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් කෘතිය සිංහලයට පරිවර්තනය කරන ලද්දේ කවරකු විසින් ද?

(v) "බසේ මුවින් පිටවුණු නිසා වැඩුණු කුහුලින
විසේ සය පියාගේ දකිති දරුවෝ දින දින"

(අ) දරුවන් පියාගේ දුටු විශේෂත්වය කුමක් ද?

(ආ) මෙහි 'දරුවෝ' යනුවෙන් හැඳින්වූ අයගේ නම් ලියන්න.

(vi) "ඒ දුසිල් පවිටි හට මෙ බඳු සීලසංයමයෙක් කොහි වෙ ද!"

(අ) මෙම ප්‍රකාශය කළේ කවරකු ද?

(ආ) එය ශ්‍රවණය කරන ලද්දේ කවරකු විසින් ද?

(vii) "සිහින්ව ගිය අත්පාවලත් සම ගසක පොත්තක් මෙන් ගොරහැඩි ව රැලි වැටී ඇටයට ඇලී ගියේ ය."

(අ) මෙම කොටස ඇතුළත් ග්‍රන්ථයේ නම ලියන්න.

(ආ) මෙහි සඳහන් උපමාව උපුටා දක්වන්න.

(viii)

රිවි	තැවුලේ	පිපි කමලේ	විල්	ගැවසී
මත	කොවුලේ	තුරු වදලේ	හඬන	නිසී
වන	සැවුලේ	මහ අසලේ	පොර	සැලසී
ගුරු	බැවුලේ	යව අවුලේ	නො වී	කිසී

(අ) මෙම පද්‍යයේ ඇතුළත් කාව්‍යාලංකාරයක් ලියන්න.

(ආ) මේ පද්‍යය ඇතුළත් සන්දේශ කාව්‍යයේ දූත ආශීර්වාදය ලියැවුණු විරිත කුමක්ද?

(ix) "මෙතැන් පටන් කොට රජ්ජුරුවන් කරන ක්‍රියාවන් දැන එවන්නේ යැ'යි කියා නැවත හසුන් යැවූ සේක."

(අ) මෙහි 'රජ්ජුරුවන්' යනුවෙන් හැඳින්වුණු පුද්ගලයාගේ නම කුමක් ද?

(ආ) මෙහි සඳහන් පරිදි හසුන් යැවූයේ කාට ද?

(x) (අ) අනුරාධපුර යුගයේ රජවරුන්ගෙන් ග්‍රන්ථකරණයට පිවිසි රජ කෙනෙකු නම් කරන්න.

(ආ) පරෙවි, සැළලිහිණි යන සන්දේශ රචනා වූයේ කිනම් ශත වර්ෂයේ දී ද?

(ලකුණු 02 × 10 = 20යි.)

2. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර සපයන්න.

i.

නිදහස මහ මුහුදක්	වේ
එහි උල්පත පුත, නුඹ	වේ
ඒ බව සිහි කොට මෙ	ලොවේ
යුතුකම ඉටු කළ යුතු	වේ

(අ) මෙම පද්‍යයෙන් දැක්වෙන රූපකාර්ථවත් පද දෙක ලියා දක්වන්න.
(ආ) කවියේ සමස්ත අර්ථය ලියන්න.

ii. "ආරච්චිගේ ගෙයි වාසය කරන්ට කෙනකු නොවූයෙන් එය කැලයට ඇරිණ. අපල ගෙන දෙන අසුබ නිමිති ඇත්තේ යයි ද අවතාර **අඩිකෝඩවලින්** පිරුණේ යයි ද ප්‍රසිද්ධව ගිය මේ ගෙයි වාසයට ඒමට තරම් **සැහැසි** වූ කිසිවෙක් ගමේ නො වූහ. මේ ගෙය වනයට විරුද්ධ ව දිග සටනක යෙදී සිටින සේ පෙනිණ."

(අ) ඉහත අංකිත පදවල අර්ථ ලියන්න.
(ආ) මේ ගෙයි වාසයට කිසිවකු නොපැමිණියේ ඇයි?

iii.

දිමුත් වෙහෙර වට විසිතුරු මල්	වතුය
එහිත් සුවඳ මල් නිති වෙයි **මිණි**	**මුතුය**
මහත් තුරු මියුරු පල ගෙන නැමී	අතුය
රැගත් සෙවණ නොහැරම සිටී පොල්	වතුය

(අ) අංකිත පදවල අර්ථ ලියා දක්වන්න.
(ආ) වෙහෙර අවට ප්‍රදේශයේ සශ්‍රීක බව කවියා විස්තර කර ඇත්තේ කෙසේ ද?

iv. "ඉදින් නොගියෙමි නම් මව මරා සසරින් නො නැඟිය හැකි වෙයි. ඔහට සංග්‍රහ කළ මැනැවැ'යි පෙරවරු **සුගත්** මහපහුල් හැඳැ පෙරෙවූ නුවර වැදැ වළඳා වෙහෙර ගොස් ඔව්හට සංග්‍රහ කටැටි වැ දෙව්රමින් නික්මැ **අධන්මඟ** පිළිපන්හු..."

(අ) ඉහත අංකිත පදවල අර්ථ ලියන්න.
(ආ) මුළු උද්ධෘතයේ ම අදහස ලිහිල් බසින් ලියන්න.

v. "රූ රැසේ අඳිනා ලෙසේ අත්
ලෙළ දිදී විදුලිය පබා
රන් රසේ එක් වන ලෙසේ වෙණ
නාදනූ පා තබ තබා
කම්පසේ දෙන සැර ලෙසේ දෙස
බල බලා නෙතගින් සබා
මම් කෙසේ පවසම් එසේ වර
සුර ළඳුන් දුන් රහ සුබා"

(අ) ඉහත අංකිත පදවල අර්ථ ලියා දක්වන්න.
(ආ) සුර ළඳුන්ගේ රංගන විලාසයේ සුන්දරත්වය කවියා දක්වා ඇති අන්දම කෙටියෙන් ලියන්න.
(ලකුණු 04 × 5 = 20යි.)

3.

- අවස්ථෝචිත ලෙස බස හසුරුවා ගන්නා ආකාරයත්
- කථා රසය උද්දීපනය වන ලෙස අවස්ථා ගැළපීමත්
'උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව' පාඨක සිත් ඇද ගැනීමට හේතු වී ඇත. සද්ධර්මරත්නාවලියේ නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

- ස්වභාව සෞන්දර්ය වර්ණනයේ අපූර්වත්වයත්
- උපමාලංකාර භාවිතයේ නිපුණත්වයත්
නිසා සැළලිහිණි සන්දේශය උසස් කාව්‍ය නිර්මාණයක් ලෙස සාහිත්‍යකාමීන්ගේ ප්‍රසාදයට ලක් වී ඇත. නිර්දිෂ්ට කාව්‍ය ඇසුරෙන් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15යි.)

4.

- සොබාදහමේ අපූර්ව සංසිද්ධීත්
- මිනිස් දිවිය පිළිබඳ ගැඹුරු දර්ශනයත්
එකට කැටි කර ගනිමින් කළ සාර්ථක නිර්මාණයක් ලෙස 'ගංගාවේ සංගීතය' පැදි පෙළ අගය කළ හැකි ය. නිර්දේශිත කවි පෙළ ඇසුරෙන් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

නැතහොත්

- සාම්ප්‍රදායික යෙදුම් බහුල ගැමි වහරක් භාවිතයත්
- විදග්ධ භාෂාව අවස්ථානුකූල ව යොදා ගැනීමත්
හේතුවෙන් අපට වැසිකිළියක් කෙටිකතාව රසවත් නිර්මාණයක් බවට පත් වී ඇත. නිර්දිෂ්ට කෙටිකතාව ඇසුරෙන් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15යි.)

- 5, 6, 7 ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

5. රසෝද්දීපනය සඳහා උපයුක්ත ගීතවත් බස්වහර හේතුවෙන් සිංහබාහු නාට්‍යය වඩාත් සාර්ථක වී ඇත. නිර්දිෂ්ට කොටසින් උදාහරණ **තුනක්වත්** දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10යි.)

6. ආත්මාර්ථකාමී උපදේශකයකුගේ මග පෙන්වීම අනුව කටයුතු කිරීමට යෑමෙන් රජ කෙනකු පත්වන අපහසුතාව උම්මග්ග ජාතකයේ නිර්දිෂ්ට කොටසින් උදාහරණ **තුනක්වත්** දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10යි.)

7. සමාධිමත් හෙට දිනයක් පිළිබඳ අනාගත අපේක්ෂා කාව්‍යාත්මක ව ඉදිරිපත් කිරීමට මහගම සේකර දැක්වූ ප්‍රතිභාව 'දෑතේ කරගැට සිඹ සනසන්නට' පද්‍ය පන්තිය ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026

අනුහුරු ප්‍රශ්න පත්‍රය

සිංහල භාෂාව හා සාහිත්‍යය

I පත්‍රය - පිළිතුරු

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
1	3	**11**	3	**21**	1	**31**	3
2	1	**12**	4	**22**	3	**32**	4
3	4	**13**	2	**23**	2	**33**	1
4	4	**14**	4	**24**	1	**34**	4
5	3	**15**	1	**25**	2	**35**	2
6	4	**16**	2	**26**	3	**36**	3
7	2	**17**	3	**27**	2	**37**	2
8	1	**18**	4	**28**	1	**38**	4
9	2	**19**	1	**29**	4	**39**	4
10	1	**20**	3	**30**	2	**40**	3

ආදර්ශ උත්තර හා ලකුණු දීමේ පටිපාටිය

(i) (අ) ඇ / ඈ / එ / ඒ / ඓ

(ආ) ව / ෆ

(ii) කුලුණු, ආශීර්වාද

(iii) (අ) නේවාසික

(ආ) ආදාන / ග්‍රහණ

(iv) (අ) හරටුව / අරටුව

(ආ) ප්‍රතිභාව

(v) තද්ධිත පදය – දේශීය

කෘදන්ත පදය – සුදිලෙන / නර්තන

(vi) (අ) නිලධාරීහු කාර්යාල පරිශ්‍රයෙහි ඇත.

(ආ) ඇතැම් මිනිස්සු සතුන් වැනි හැසිරීම් ඇත්තෝ ය.

(vii) (අ) නිවාස + එන්

(ආ) සෝද + මින්

(viii) (අ) විශේෂ කාරණා / වෙසෙස් කරුණු

(ආ) මිහිරි නද / මධුර නාද

(ix) නිපාත පදය – බොහෝ

උපසර්ගයක් සහිත පදය – දුෂ්කරතාවන්ට

(x) (අ) කිමිදුම්කරුවෝ ජල ගැලීමට හසු වූවෙකු මුදා ගත්හ / ගත්තෝ ය.

(ආ) පක්ෂීහු අතු ඉතිවල කැදලි තනති. / තනන්නේ ය.

(ලකුණු 2 x 10 = 20යි)

02. ආදර්ශ මාතෘකා හා අන්තර්ගතය සකස් විය යුතු ආකාරය පිළිබඳ සංක්ෂිප්ත මඟ පෙන්වීමක්:

(අ) සාහිත්‍යය කෙරෙහි මිනිසා යොමු වීමේ වැදගත්කම.

- සාහිත්‍යය යනු කුමක් ද?
- සාහිත්‍යය ඇසුරු කිරීමේ වැදගත්කම
- ඒ සඳහා පාසල් දරුවන් පෙලඹවීමට යෝජනා (ප්‍රායෝගික විසඳුම් සහිත)

(ආ) කෘත්‍රිම බුද්ධියෙහි ඇති වාසි සහ අවාසි

- තාක්ෂණය පිළිබඳ හැඳින්වීම.
- කෘත්‍රිම බුද්ධිය යනු කුමක් ද?
- මිනිසාගේ අභිවෘද්ධියට කෘත්‍රිම බුද්ධිය උපයෝගී කර ගන්නා ආකාරය
- කෘත්‍රිම බුද්ධියෙහි පවත්නා ප්‍රබලතා සහ දුබලතා

(ඉ) මැද පෙරදිග යුද්ධය අර්බුදය හා ලෝකය

- යුද්ධය තත්ත්වය නිර්මාණය වීම කෙරෙහි වූ පසුබිම.
- එයින් කලාපයට එල්ල වී ඇති බලපෑම.
- ඒ හේතුවෙන් ලෝකයට ම මුහුණ දීමට සිදුව ඇති අර්බුදය
- ලෝක සාමයෙහි වටිනාකම.

(ඊ) ආපදා කළමනාකරණය හා අභියෝග ජයගමු

- ආපදා කළමනාකරණය යනු කුමක් ද ?
- මෑත කාලයේ ලෝකයේ රටවල් මුහුණ පෑ ස්වාභාවික ආපදා
- ශ්‍රී ලංකාව මෑත කාලීනව මුහුණ දුන් ස්වාභාවික ආපදා
- මේ හේතුවෙන් ඇති ව ඇති අර්බුද හා ඒවා ජය ගැනීම සඳහා යෝජනා

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25යි.

1. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08 යි.
2. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි.
3. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි.

01. සාරවත් භාවය - ලකුණු 07 යි.
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01 යි.

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යූහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු ය.

සාරවත්භාවය මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08

මාතෘකාව ද සහිත ව සාරවත් කරුණු ප්‍රමාණවත් ව ඉදිරිපත් කිරීම, මාතෘකාව රචනාවට ගැළපෙන බව, මනා භාෂා භාවිතය, තේමාවට අදාළ ව ලියා තිබීම, සරුබව හා සමබව නිවැරදි ව රැක තිබීම, වචන 250ට සමීප ව පැවතීම	8-7
සාරවත් කරුණු කිහිපයක් පමණක් ඉදිරිපත් කිරීම, මාතෘකාව ද රචනාවට ගැළපෙන පරිදි යොදා තිබීම, භාෂා ශෛලිය තරමක් හොඳින් පැවතීම, තේමාවට අදාළ බව තරමක් දුරස් වීම, සමබවෙහි හා සරුබවෙහි තරමක් දුර්වලතා පැවතීම, වචන ගණන 200ට වඩා අඩු වීම	6-5
සාරවත් කරුණු ප්‍රමාණවත් පරිදි නොතිබීම, භාෂා ශෛලියේ දුර්වලතා පැවතීම, තේමාවට අදාළ නොවීම, මාතෘකාවක් යොදා තිබීම, සරුබව හා සමබව නොපැවතීම, වචන ගණන 200ට අඩු වීම	ලකුණු 4ට අඩු

සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය - ලකුණු 12

උසස් ප්‍රකාශන ශක්තිය, මැනවින් කරුණු සංවිධානය කර තිබීම, ස්වීයත්වය ප්‍රදර්ශනය කිරීම, නිර්මාණාත්මක ව ලියා තිබීම, නිරවුල් බව, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය භාවිත කිරීම	12-10
ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානයේ දී දුර්වලතා තරමක් දක්නට ලැබීම	9-7
ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානය කර ගැනීමේ දී දුර්වලතා දක්නට ලැබීම, ස්වීයත්වයෙහි ගැටලු දක්නට ලැබීම, නිර්මාණාත්මක ව කරුණු ඉදිරිපත් කිරීමේ ගැටලු පැවතීම, භාෂා ව්‍යවහාරයෙහි දුර්වලතා පැවතීම	6- 4
ප්‍රකාශන ශක්තියෙහි බොහෝ දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානය කර ගැනීමේ දී බොහෝ දුර්වලතා දක්නට ලැබීම, ස්වීයත්වය ප්‍රදර්ශනය නොකිරීම නිර්මාණාත්මක භාවය දක්නට නොලැබීම, නිරවුල් නොමැති වීම, භාෂා ව්‍යවහාරයේ බොහෝ දුර්වලතා පැවතීම	3-1

ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි.

ව්‍යාකරණ රීති නිවැරදි ව අනුගමනය කර තිබීම, පැහැදිලි අත් අකුරු භාවිත කිරීම, විරාම ලක්ෂණ නිවැරදිව භාවිත කිරීම, නිවැරදි ඡේද වෙන් කිරීම, අක්ෂර වින්‍යාස රීති භාවිතය	5
ව්‍යාකරණ දෝෂ, අපැහැදිලි අත් අකුරු, විරාම ලක්ෂණමය දෝෂ, අක්ෂර දෝෂ තරමක් පැවතීම	4-3
ඉහත දෝෂ බහුල වීම	1

3. සාරාංශය:

- මහින්දාගමනය ලංකා සංස්කෘතියේ අතිශය වැදගත් සිද්ධියයි.
- මහින්දාගමනයට පෙර සිටත් මෙරට වැසියන් බුදුදහම දැන සිට ඇත.
- බුදුන් වහන්සේගේ පළමු ලංකාගමනය සිදු වූයේ මහියංගණයටයි.
- එහිදී යක්ෂයන්ට ධර්මාභිසමය සිදු වූ අතර සුමන දෙවියන් සෝවාන් ඵලයට පිවිස බුදුහිමියන්ගෙන් ලද කේශධාතු නිදන් කොට මහියංගණයේ ස්තූපයක් ඉදි කළහ.
- දෙවන ලංකාගමනය සිදු වූ නාගදීපයේදී මණි අක්ඛිත නා රජු බුදුසමය වැලඳ කළ ආරාධනයෙන් තෙවන වර කැලණියට වැඩියහ.
- පසුව සරභූ තෙරණුවෝ බුදුහිමිගේ අකුධාතුව තැන්පත් කොට මහියංගණ ස්තූපය උස් කොට තැනවූහ.

ලකුණු බෙදීම:

1. අන්තර්ගතය – ලකුණු 06යි
2. වචන ගණන – ලකුණු 02යි
3. ශිල්පීය දක්ෂතා – ලකුණු 02යි

එකතුව – ලකුණු 10යි.

උපදෙස්:-

- වචන ගණන 80 ඉක්මවන කල්හි මුල් වචන 75 පමණක් ඇගයීමට ලක් කරන්න.
- වචන ගණන 60ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් පමණක් සැලකිල්ලට ගෙන ලකුණු පිරිනමන්න.
- ඡේද බෙදා ඇත්නම් ශිල්පීය දක්ෂතා කොටසින් ලකුණක් අඩු කරන්න.
- එක යට එක අසම්බන්ධිත වාක්‍ය ලෙස ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02කි.
- වචන ගණන 80ට වැඩි කල්හි හෝ 60ට අඩු කල්හි ලකුණක් අඩු කරන්න.
- දුර්වල සාරාංශ සඳහා බිංදුව දී ලකුණු 03ක උපරිමයකට යටත් ව ලකුණු පිරිනමන්න.

සාරාංශයේ අන්තර්ගතය සඳහා ලකුණු පිරිනැමීම - ලකුණු 06:

විස්තරය	ලකුණු
ප්‍රධාන කරුණු ඉදිරිපත් කර තිබීම, වාක්‍ය අතර සම්බන්ධතාව ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම, නිරවුල් ව කරුණු ඉදිරිපත් කිරීම, වචන ගණන අදාළ සීමාව තුළ පැවතීම.	05 – 06
ප්‍රධාන කරුණු කිහිපයක් පමණක් ඇතුළත් වීම, වාක්‍ය අතර සම්බන්ධතාව තරමක් රැක ගැනීම, වචන ගණන 60 – 70 අතර පැවතීම, නිරවුල් බව රැක ගැනීම.	03 – 04
ප්‍රධාන කරුණු ස්වල්පයක් පමණක් ඉදිරිපත් කර තිබීම, වාක්‍ය අතර සම්බන්ධතාව ගිලිහී තිබීම, වචන ගණන 60ට අඩු වීම, නිරවුල් බව ගිලිහී තිබීම.	01 – 02

4. ප්‍රශ්නයට පිළිතුරු:

(i) සෙල් ලිපිවල නිලධාරීන් ගණනාවක් ගැන අසන්නට ලැබීම

(ii) පරිපාලන තන්ත්‍රය හා සම්බන්ධ නිලධාරීන් නගරය වටා කේන්ද්‍රගත වීම, යුද හමුදා නිලධාරීන් හා සොල්දාදුවන් රාජ්‍ය මධ්‍යස්ථානය වටා එක් වීම, පරිපාලන කටයුතු ඉටු කර ගැනීමට සෙසු ප්‍රදේශවලින් ජනයා පැමිණීම, කම්කරු ජනයා නගරය වටා කේන්ද්‍රගත වීම

යන කරුණු අතුරින් දෙකක් ලියා තිබිය යුතු ය.

(iii) සාහිත්‍යමය මූලාශ්‍ර, පුරා විද්‍යාත්මක මූලාශ්‍ර

(iv) නිකොලස් මහතා

(v) අතදක, බඩ කරක, ගණක, රටික යන තනතුරුවලින් දෙකක් ලියා තිබිය යුතු ය.

(ලකුණු 2×5 = 10යි.)

5. ප්‍රශ්නයට පිළිතුරු:

රාජකාරි ලිපිය:

1. ආකෘතිය – ලකුණු 05 යි.
2. අන්තර්ගතය – ලකුණු 07 යි.
3. ශිල්පීය දක්ෂතා – ලකුණු 03 යි.

මුළු ලකුණු – 15 යි.

1. ආකෘතිය – ලකුණු 05

1. යවන්නාගේ ලිපිනය – ලකුණු 01 යි.
2. දිනය – ලකුණු 01 යි.
3. ලබන්නාගේ ලිපිනය හා නිල තනතුර – ලකුණු 01 යි.
4. මාතෘකාව – ලකුණු 01 යි.
5. අත්සන, නම හා තනතුර – ලකුණු 01 යි.

2. අන්තර්ගතය – ලකුණු 07

1. පානීය ජලය හිඟ බව - ලකුණු 01 යි.
2. පානීය ජල ව්‍යාපෘතියක අවශ්‍යතාව - ලකුණු 01 යි.
3. ඊට සුදුසු ස්ථානයක් හා ජල මූලාශ්‍රයක් ඇති බව - ලකුණු 01 යි.
4. ‘සවිතා’ සුබසාධක සංගමයේ කැපවීම - ලකුණු 01 යි.

5. ස්වේච්ඡා සංවිධානයක සහයෝගයේ අවශ්‍යතාව - ලකුණු 01 යි.

6. අවශ්‍යතා හා ඒවා ලබා ගැනීමේ පහසුකම් - ලකුණු 01 යි.

7. 'ජනෝදා' සංවිධානයෙන් කරන ඉල්ලීම. - ලකුණු 01 යි.

3. ශිල්පීය දක්ෂතා : ලකුණු 03

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්තාඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි ව වචන වෙන් කිරීම, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම වැනි කාරණා සමස්තයක් ලෙස ගෙන ලකුණු පිරිනමන්න.

- **පුවත්පත් වාර්තාව**

1. ආකෘතිය – ලකුණු 03
2. අන්තර්ගතය – ලකුණු 09
3. ශෛලිය හා ලේඛන – ලකුණු 03

මුළු ලකුණු 15

1. ආකෘතිය – ලකුණු 03

1. මාතෘකාව – ලකුණු 01
2. වාර්තාකරු දැක්වීම – ලකුණු 01
3. යෝග්‍ය ලෙස සිද්ධි ගැළපීම – ලකුණු 01

2. අන්තර්ගතය – ලකුණු 09

1. උත්සවය හා සංවිධායකයන් – ලකුණු 02
2. දිනය හා වේලාව – ලකුණු 01
3. ස්ථානය – ලකුණු 01
4. ප්‍රධාන ආරාධිතයින් – ලකුණු 01
5. විශේෂ දේශනය – ලකුණු 01
6. සම්මාන සහතික පත් පිරිනැමීම – ලකුණු 01
7. නැටුම් ගැයුම් හා විචිත්‍රාංග – ලකුණු 02

3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්තාඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, වචන වෙන් කිරීම, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම වැනි කාරණා සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

(ලකුණු 15)

ආදර්ශ උත්තර හා ලකුණු දීමේ පටිපාටිය

(1)

i) (අ) වස්සානය

ආ) රත්න ශ්‍රී විජේසිංහ

ii) (අ) මහජන සෞඛ්‍ය පරීක්ෂක / සෞඛ්‍ය පරීක්ෂක

(ආ) හේරත් / පටබැඳිගේ හේරත්

iii) (අ) අහසින් බැස රහ ගත් රහ කෙලෙසී

(ආ) දිසි මෙන් විය විදුලිය සිය දහසී

iv) (අ) ආභරණයක් / කනට කරට දා ගන්න දෙයක් ෆොරොස්ටියර්ගෙන් ලබා ගැනීමට හැකි බව

(ආ) කේ. ජී. කරුණාතිලක

v) (අ) සිංහයෙකු වීම / තමා හා සම නොවීම

(ආ) සිංහබාහු, සිංහසීවලී

vi) (අ) කොසොල් රජ

(ආ) බුදු රජාණන් වහන්සේ

vii) (අ) බැද්දේගම

(ආ) ගසක පොත්තක් මෙන්

viii) (අ) අනුප්‍රාසය / එළිසමය / විරිත/ ස්වභාවෝක්තිය

(ආ) යහ ගී විරිත

ix) (අ) චූලනී බ්‍රහ්මදත්ත/ බ්‍රහ්මදත්ත

(ආ) වර පුරුෂයන්ට

x) (අ) පස්වන කාශ්‍යප /සිවුවන සේන

(ආ) පසළොස්වන

(ලකුණු 2x10=20)

(2)

i) (අ) මහ මුහුද / උල්පත

(ආ) නිදහස මහ මුහුදකි. එයට ජලය සපයන උල්පත වන්නේ පුතු ය. ඒ පිළිබඳව සිහි තබා ගනිමින් තමන්ගෙන් රටට ඉටුවිය යුතු යුතුකම් ඉටු කළ යුතු ය.

(මේ අදහස ඇත්නම් ලකුණු පිරිනමන්න.)

ii) අ) අඩිකෝඩ – කරදර

සැහැසි – දරුණු

ආ) ■ වසර තුනක් මුළුල්ලේ විනාශ නොවී පැවතීම

■ උස් වහලය හා බිත්ති ඝනකමින් හා ශක්තියෙන් යුතු වීම

■ මහා වැස්සට පවා ඔරොත්තු දීම

iii) (අ) දිමුත් – දීප්තිමත් / බබළන

මිණිමුතු – විකසිත / පිපුණු / පුබුදු / මණියෙන් මුක්ත වූ

ආ) ■ විශාල ගස්වල රසවත් පලවලින් බර වී, අතු බිමට නැමී තිබීම

■ පොල් ගස්වල සරු බව, පොල් අතු අතරින් හිරු එළිය පොළොවට පතිත නොවන තරම් අතු විහිදී ඇති බව

iv) (අ) සුගත් – බුදුන් වහන්සේ

අධන්මග – දීර්ඝ මාර්ගය

(ආ) එසේ නොගොස් සිටියේ නම් තම මව මරා සංසාරයෙන් කිසිදා එතෙර විය නොහැකි වෙයි. ඔහුට පිහිට විය යුතු'යි සිතා උදෑසන බුදුන් වහන්සේ මහා පාංශුකූල සිවුර හැඳ පෙරවා ගෙන නුවරට ගොස් පිඬු සිහා වළඳා වෙහෙරට ගොස් ඔහුට පිහිට වීමේ අදහස ඇතිව දෙව්රමින් නික්මී දීර්ඝ මාර්ගයට පිවිසියාහ.

(v) (අ) නාදනු - නාද අනුව

කම්පසේ – අනංග / මල්සරා / මින්දද / අනංග/ කුසුම්සර ... ආදි පර්යාය පදයක්

ආ) ■ රූප රාශියක් අඳිනා ලෙසේ විදුලිය ප්‍රභා ඇති අත් ලෙළ දීම

■ වීණා තාලයට අනුව පාද එකවර තැබීම

■ අනංගයාගේ හී සැර පහර විදින සේ ඇස් කොනකින් සභාව දෙස බැලීම

(ලකුණු 4x5=20)

03.

<u>උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව</u>

- **අපේක්ෂිත කරුණු :**

  අවස්ථාවට උචිත ලෙස භාෂාව යොදා ගෙන තිබෙන ආකාරය සහ කතා පුවතෙහි රස මතු වන ලෙස අවස්ථා නිරූපණය කර තිබෙන ආකාරය ගැළපෙන උදාහරණ මඟින් විස්තර කර තිබීම අපේක්ෂා කෙරේ.

- **අවස්ථෝචිත ලෙස බස හැසිරවීම:**
  - **උචිත උපමා යෙදීම:**
    "පැසුණු ගොයම් මුල් වූවා සේ"
    "කරග රහත් වන්නා සේ නොවන බව මුත්"
  - **කෙටි වැකි උචිත ලෙස යෙදීම:**
    "... සක්මනුත් කෙරෙයි; නටයි; ගීත් කියයි"
    "මදුව විකුණන්නා නැත; රන් හැරගෙන නොදෙමි"
  - **හැඟීම් ප්‍රකාශනයට උචිත ලෙස බස යෙදීම:**
    "ලදොත් ජීවත් වෙමි. නොලදොත් මියෙමි"
    "තොප ගිය මැන හුන මැන"
- **කතා රසය උද්දීපනය වන ලෙස අවස්ථා නිරූපණය:**
  - **විද්දන් දියණිය දුටු උග්ගසේන වික්ෂිප්ත වූ අවස්ථාව:**
    "... නො කා නො බී හැඳට නැගිලා, වැද හොත්තාහ."
  - **සියල්ල අතහැර උග්ගසේන විද්දතුන් කරා යන අවස්ථාව:**
    "... නෑයන් සියන් නො එක් ලෙසින් නැවතුවත්... විද්දතුන් ළඟට ගියාහ."
  - **විද්දත් දියණිය උග්ගසේන ප්‍රතික්ෂේප කරන අවස්ථාව:**
    "... තොප කුමකුත් නොදන්නා තැනැත්තවුන්ගෙන් මට කම් කිම් ද?"

[මෙබඳු වෙනත් යෝග්‍ය උදාහරණ දෙමින් කරුණු විස්තර කර ඇත්නම් ඒවා ද පිළිගන්න]

- **නිදර්ශන** – ලකුණු 04
- **විග්‍රහය** – ලකුණු 11
- **මුළු ලකුණු** = **15**

නැතහොත්

<u>මග විසිතුරු - සැළලිහිණි සන්දේශය</u>

- **අපේක්ෂිත කරුණු :**
  සැළලිහිණි සන්දේශයේ ස්වභාව සෞන්දර්ය අපූර්ව ලෙස වර්ණනා කර ඇති ආකාරය සහ නිපුණ ලෙස උපමා භාවිත කර ඇති ආකාරය උචිත උදාහරණ දෙමින් විස්තර කර තිබිය යුතු ය.
- **ස්වභාව සෞන්දර්ය වර්ණනාව:**

අග පිපි මල් මැලි ගිය ලිය *කැලේයා*
වග බැඳ හෙන රජ හස පුල් *විලේයා*
ළඟ තුරු මල් ගිලිහුණු රොන *වුලේයා*
මග බැස යව පළ හෙළ වැලි *තෙලේයා*

රිවි නැවුලේ පිපි කමලේ විල් *ගැවසී*
මත කොවුලේ තුරු වදලේ හඬන *නිසි*
වනසැවුලේ මග අසලේ පොර *සැලසී*
ගුරු බැවුලේ යව අවුලේ නොවී *කිසි*

මග නිලමින් සිටි නා දොඹ නී *පියල*
පිය සලමින් මලගෙහි කෙළෑ *රොනිනවල*
තතුඩලමින් බිඳෑ විලිකුන් මියුරු *පල*
ඉසුඹු ලමින් යෙහි සැළ! දඹ *පදුරුවල*

- **උපමාලංකාර භාවිතය:**

වනසිරි <u>පියුම් රා බඳ රනබරණ</u> *<u>යුරු</u>*
වටපිරි සුපුල් දුනුකේ මල් මුරුත *තුරු*
බිඳු පිරිවැරූ ඔලු 'පුලැ 'ඹුලවල *තඹුරු*
<u>හිම සරි</u> සිහිල් දිය හෙබ දැක යන් *මිතුරු*

<u>වලඳින අදහසින් මෙන්</u> සුර ගඟ *අඟන*
නලබල සසල දළ රළ පෙළ නුබ *නැඟෙන*
වෙල ලස ගැවසි මුතු සක් පබළු *බබළන*
බල මහ මුහුද එම සඳ උතුරින් *පෙනෙන*

<u>ගනේ මිණි බැබළි කිරණෙව්</u> සත *පාය*
රනේ යටග සැවුලිඳු දද *ගළපාය*
අනේ ලකර කළ පුර අප නර *පාය*
පෙනේ දකුණු මහසෙන් දෙව්රද *පාය*

[මෙහි වෙනත් යෝග්‍ය උදාහරණ මඟින් කරුණු විස්තර කර ඇත්නම් ඒවා ද පිළිගන්න]

- **නිදර්ශන** - ලකුණු 04
- **විග්‍රහය** - ලකුණු 11
- **මුළු ලකුණු** **= 15**

04.

<u>ගංගාවේ සංගීතය</u>

- ස්වභාව ධර්මයේ අපූර්ව සංසිද්ධි ඉදිරිපත් කර ඇති ආකාරය සහ මනුෂ්‍ය ජීවිතය පිළිබඳ ගැඹුරු ජීවන දර්ශනයක් මතු කර ඇති ආකාරය උචිත උදාහරණ මඟින් තහවුරු කර තිබීම මින් අපේක්ෂා කෙරේ.
- **ස්වභාව ධර්මයේ අපූර්ව සංසිද්ධි:**
  - **කඳු මුදුනක සිට පහළට ඇදෙන ගංගාව:**

කඳු බෑවුමක දම් බෝවිටි පදුරු *තලා*
පහළට ඇදී පරමල් පෙති ඉවත *නොලා*
කලදෝ දියෙන් පොඟවා රන් පුලින *තලා*
සංගීතවත් වී යමි ඉදිරියට *ගලා*

  - **සඳ ඇති රැයක වනය මැදින් ගලා හැලෙන ගංගාව**

රන් තරු පිරිවරා ගත් සඳ මඬල *යට*
මහ වන බිමක් මැද ගිරිකුළ අතර *සිට*
නොමියෙන හේලි දහමක පණිවිඩය *පිට*
කොදුරම් කෙදිරියක් මුළු ලොව නිසල *කොට*

- **මිනිස් දිවිය පිළිබඳ ගැඹුරු දර්ශනය:**
- **මිනිස් ජීවිතයේ අනිත්‍ය ස්වභාවය**

මී අඹ කිරල මාදම් ගෙඩි ළදරු *වියේ*
ඇකයෙහි හෙලා හඬවයි සැඩ සුළඟ *රැයේ*
සුළි මැද කැරකෙමින් ඉදුනිල් ගැඹුරු *දියේ*
සමහර තැනක ලස්සන මල් කැකුළු *තියේ*

- **පුනර්භවය හා දාර්ශනික ගැටලු**

එන්නේ කොහි සිට ද කොතැනකට ද *යන්නේ*
ඔබ කුමකට ද මා දුටු විට *විමසන්නේ*
මිනිසුන් ගිහින් නිතරම ආපසු *එන්නේ*
කිමදැයි කියා කිසිවෙකු ඇයි *නොසොයන්නේ*

[මෙබඳු වෙනත් යෝග්‍ය වූ උදාහරණ දක්වමින් විස්තර කර ඇති උත්තර ද පිළිගන්න]

- **නිදර්ශන** – ලකුණු 04
- **විග්‍රහය :** – ලකුණු 11
- **මුළු ලකුණු** = **15**

නැතහොත්

<u>අපට වැසිකිළියක්</u>

සාම්ප්‍රදායික යෙදුම් බහුල ගැමි වහර යොදාගෙන ඇති ආකාරය සහ වියත් බස අවස්ථානුකූල ලෙස යොදාගෙන ඇති ආකාරය උචිත උදාහරණ දෙමින් විග්‍රහ කර තිබීම මෙහිදී අපේක්ෂා කෙරේ.

- **සාම්ප්‍රදායික යෙදුම් බහුල ගැමි වහර**
  - උචිත පිරුළු භාවිතය
    "කම්මලේ සිටින බල්ලාට යකඩ තලන හඬ මෙන්"

    "නොකෙරෙන වෙදකමට කෝදුරු තෙල් හත් පට්ටයක් සොයන්නට"
  - උචිත ඉඟි වැකි භාවිතය
    "හෙන හුරා පාත් වූයේ", "ගසා බසා දමා", "හොර අලියා", "මගෝඩියක්", "උසාවි බඩගාන්න"
  - ග්‍රාමීය කටවහර භාවිතය
    "හැමදේම බැහ්! බැහ්! කට විතරයි හොල්ලන්න පුළුවන්. කෑම් පීම් සේරම දෙපා මුලට පහළ වෙයි බලා හිටපිය."
- **විදග්ධ භාෂා යෝජනය**

  "අපට ඉගැන්වූ විෂයයන් අතර සෞඛ්‍ය විද්‍යාව ද විය. විෂබීජ හා ක්ෂුද්‍ර ප්‍රාණීන් පිළිබඳව ද මෙහිදී උගන්වනු ලැබිණ."

  "යක්ෂ දෝෂ හා ප්‍රේත දෝෂවලින් ද ලෙඩ හටගන්නා බව ඔවුන් අතර ඇති වූ කතාබස්වලින් පැහැදිලි විය."

  "ඔහු කතා කළේ කවර භාෂාවක් ද? වචන සිංහල වුවත් උච්චාරණය සිංහල නොවී ය."

මෙබඳු වෙනත් යෝග්‍ය උදාහරණ යොදාගෙන විස්තර කර ඇත්නම් ඒ උත්තර ද පිළිගන්න.

- **නිදර්ශන** - ලකුණු 04
- **විග්‍රහය** - ලකුණු 11
- **මුළු ලකුණු** = **15**

05

<u>ලෙන අතහැර යාම</u>

සිංහබාහු නාට්‍යයේ උපයුක්ත ගීතාත්මක භාෂා ව්‍යවහාර හේතුවෙන් එහි රසය උද්දීපනය වූ ආකාරය ඊට උචිත උදාහරණ මගින් විස්තර කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.

- **සිංහයාගේ විලාපය**

  "ගල්ලෙන බිඳලා

  ලෙන්දොර හැරලා

  සිංහබා සිංහබා සිංහබා"

  "මා සොඳුර මා සොඳුර මා සොඳුර

  සිංහ සීවලී මා ප්‍රිය දියණිය"

- **සිංහබාහුගේ අභිමානය**

  "තුමුල ගතින්දා

  බාහු බෙලෙන්දා

  වෙමි සේ නිදසින්දා

  කුරිරු ගිජින්දා

  කුඹු තල සින්දා

  ලමි සේ කෙසරින්දා"

- **සුප්පාදේවියගේ ශෝකී හැඟීම් ප්‍රකාශනය**

  "සඟවන්න බැරිය තතු පුතුගෙන්

  මිගිදා නිතින සොඳිනා පෙනෙන විලසා

  අදහන්නේ නැත කීවද මුසා

  නැණ මූකුරා ගොස් ඇත පුරා වයසා"

[මෙබඳු ගීතාත්මක ලක්ෂණ ප්‍රකට කරන වෙනත් යෝග්‍ය උදාහරණ සහිත විස්තර කිරීම් ද උත්තර ලෙස පිළිගන්න.]

- **නිදර්ශන** - ලකුණු 03
- **විග්‍රහය** - ලකුණු 07
- **මුළු ලකුණු** = **10**

Past Papers Wiki

06

සතර කන් මන්ත්‍රණය

කේවට්ට බමුණාගේ ආත්මාර්ථකාමී උපදේශ අනුව කටයුතු කිරීමට යාමෙන් බ්‍රහ්මදත්ත රජු අපහසුතාවට පත්වන අයුරු උචිත උදාහරණ මගින් විස්තර කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.

- **ආත්මාර්ථකාමී උපදේශ සැපයීම**
  "රජ්ජුරුවන් සියලු දඹදිව අග රජ කළොත් යහපත. එසේ වුවහොත් මමත් අග්‍ර පුරෝහිත වෙමි."
- **බ්‍රහ්මදත්ත රජු ඒ උපදේශ අනුව කටයුතු කිරීම**
  "බමුණන්ගේ බස් අසා සතුටුව "කියව ආචාරීනි තොප කීවාක් කෙරෙමි"

  "රජ්ජුරුවෝ යහපත ආචාරයෙනි තොප කී ලෙස ම කෙරෙමි කීහ."

- **බ්‍රහ්මදත්ත රජු අපහසුතාවට ලක්වීම**
  "එබැවින් අපි පැරද්දමිහ. අපගේ ජීවිතය ට නොදෙන්නාහයි භයින් තැති ගෙන"

  "බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා ඒ සා මහත් සේනාව හා දොළොස් ගව්වක් තැන් බිඳී පලා ගියහ."

[මෙබඳු වෙනත් යෝග්‍ය උදාහරණ සහිත ව කරුණු විග්‍රහ කර ඇත්නම් ඒවා ද උත්තර ලෙස පිළිගන්න.]

- නිදර්ශන - ලකුණු 03
- විග්‍රහය - ලකුණු 10
- මුළු ලකුණු = **10**

07

දෑතේ කරගැට සිඹ සනසන්නට

සමෘද්ධිමත් වූ අනාගතයක් පිළිබඳ සුබවාදී අපේක්ෂා කාව්‍යාත්මක ව ඉදිරිපත් කිරීමේදී මහගම සේකර සතු ප්‍රතිභාව මේ උත්තරයෙන් විස්තර කර තිබීම අපේක්ෂා කෙරේ.

- **සමෘද්ධිමත් අනාගතයක් සඳහා වැඩිහිටියන්ගේ කාර්යභාරය කාව්‍යාත්මකව ඉදිරිපත් කිරීම**
  "ඔබ හට ලෝකය ඉදිකර දී මිස

  යා නොහැකිය මට පුංචි පුතුන්"
- **ශ්‍රමය හා වෙහෙස අනාගත අපේක්ෂා උදෙසා සතුටින් භාර ගැනීම කාව්‍යාත්මකව දැක්වීම**
  "ඒ ගත වෙහෙස ම සතුටක් වෙයි මට

  ඔබ සිහිවන විට පුංචි පුතුන්"
- **දරුවන්ගේ සතුට උදෙසා අරමුණු සකස් වී ඇති බව කාව්‍යාත්මකව ඉදිරිපත් කිරීම**
  "ණය නැති බිය නැති නිවහල් යුගයක

  පුංචි පුතා රජ කරනු පෙනේ"

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- **අනාගත සමෘද්ධිය හා සශ්‍රීකත්වය පිළිබඳව අපේක්ෂාවට සොබාදහමේ ආශීර්වාදය ලැබෙන බව කාව්‍යාත්මක ව ඉදිරිපත් කිරීම**

"දෑතේ කරගැට සිඹ සනසන්නට
ළා ගොයමේ දලු පවන් සලයි
දහදිය මුතු ඇට මල් වරුසාවී
කරල් බරින් පීදී වැගිරෙයි"

[මෙබඳු වෙනත් යෝග්‍ය උදාහරණ දැක්වූ විස්තර මගින් ප්‍රශ්නයට අදාළ ව උත්තරය සකස් වී ඇති විට ඒ උත්තර ද පිළිගන්න.]

- **නිදර්ශන** – ලකුණු 03
- **විග්‍රහය** – ලකුණු 10
- **මුළු ලකුණු** = **10**

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank